(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 210.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2017 නොවැම්බර් මස 11 වැනි සෙනසුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

544/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය අවසන් වනවිට ශ්‍රී ලංකාව තුළ මී කිරි නිෂ්පාදනය තම ජීවිකාව කරගත් පිරිස කොපමණද;

(ii) 2015 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ මී කිරි නිෂ්පාදනය ලීටර් ප්‍රමාණය කොපමණද;

(iii) 2015 වර්ෂය අවසානයේදී ශ්‍රී ලංකාව තුළ සිටි මී ගවයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මී කිරි කර්මාන්තයේ නිරතවන්නන්ට එම කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් රජය විසින් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම පහසුකම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මී ගව ගහනය වැඩි කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1224/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළව වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1401/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 173 යෝජනාවට අනුව, ග්‍රාමීය කෘෂිකර්මාන්තයට සහාය වනු පිණිස, කුඩා වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණ කිරීම සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 2000ක ප්‍රතිපාදනය මඟින් 2016 වර්ෂය තුළදී ප්‍රතිසංස්කරණය කරන ලද කුඩා වැව් හා ඇළ මාර්ග සහ ඒ වෙනුවෙන් දරන ලද පිරිවැය ඇතුළත් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) නොඑසේ නම්, මන්ද;

(iii) කුඩා වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය පිළිබඳ වගකීම පවරන ලද අමාත්‍යාංශය සහ එම අමාත්‍යාංශයට 2016 වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරය විසින් මුදා හරින ලද මුදල් ප්‍රමාණය කවරේද;

(iv) රුපියල් මිලියන 2000ක් වූ මෙම දැවැන්ත ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීමට විවිධ මට්ටමින් දායක වූ ආයතන හෝ සංවිධාන කවරේද;

(v) ව්‍යාපෘතියෙහි අධීක්ෂණ කටයුතු වෙනුවෙන් වැය කරන ලද මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1476/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ලංකාව තුළ ක්‍රියාත්මක වන පෞද්ගලික විදුලිබල ජනන සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම්වල නම්, ලිපිනයන් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට එම එක් එක් සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දුන් විදුලි ඒකක සංඛ්‍යාව සහ එම එක් සමාගමකට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවන ලද මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වත්මන් යහපාලන රජය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය මඟින් සිදු කරනු ලබන විදුලි ජනනය වැඩි කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1578/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රටේ සමස්ත බදුවලින් 57 %ක් අයකර ගනු ලබන්නේ ශ්‍රී ලංකා රේගුව විසින් බවත්;

(ii) ඉන් වැඩි බදු ප්‍රතිශතයක් වාහන ආනයන බදු බවත්;

(iii) බදු නොගෙවීමට වාහන ආනයනකරුවන් විවිධ උපක්‍රම භාවිතා කරන බවත්;

(iv) දැනට නිකුත් කර ඇති අති විශේෂ ගැසට් නිවේදනවලට අමතරව, 2015.02.10 දිනැති අංක 1901/3 ගැසට් නිවේදනය මඟින්ද, මෙම තත්ත්වය මහ හැරවීමට නියෝග පනවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කෙසේ වෙතත්, 2015.09.22 දිනැති අංක 1933/6 ගැසට් නිවේදනයෙන් ජාවාරම්කරුවන්ට රිසි ලෙස කටයුතු කිරීමට අවස්ථාව ලබා දී ඇති බවත්;

(ii) අ (iv)හි සඳහන් ගැසට් නිවේදනයෙන් ලබා දුන් අධිකාරි බලය මත රේගු නිලධාරින් අනාවරණය කරගත් මිල අඩුවෙන් සඳහන් වාහන 1000 සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කළහොත්, රු.මිලියන 8000කට අධික ආදායමක් අය කර ගත හැකි බවත්;

(iii) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝගය අනුව 2016.09.21 දින සියලු රේගු පරීක්ෂණයන් තාවකාලිකව අත්හිටුවා දැනට මාස 04ක් ගතවීමෙන් රටට විශාල ආදායමක් අහිමි වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, අ (iv)හි සඳහන් නියෝගය අවලංගු කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1783/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධිකරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1990 දෙසැම්බර් මස 31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ ක්වාසි විනිසුරුවන් වශයෙන් පත්කරනු ලැබ සිටි තැනැත්තන් කවුරුන්ද;

(ii) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම ක්වාසි අධිකරණ කලාප ආවරණය වන ග්‍රාම නිලධාරි වසම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එම ක්වාසි අධිකරණ කලාප වශයෙන් ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදන අංක හා දින සභාගත කරන්නේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1859/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මහානගර සැලසුම (Megapolis Plan) යටතේ 2017 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 03ක් දක්වා මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් කවරේද;

(ii) දැනටමත් යම් වැඩසටහන් ආරම්භ කර ඇත්නම්, ඒවා කවරේද;

(iii) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් නිශ්චිත වශයෙන් පටන් ගන්නා දින වකවානු කවරේද;

(iv) මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) දැනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ සඳහා ණය මුදල් ලබා ගන්නේද;

(iv) එසේ නම්, ණය ලබා ගන්නා ආයතන සහ ණය ප්‍රමාණය කොපමණද;

(v) නොඑසේ නම්, රජය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1879/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08 දින සිට මේ දක්වා කැබිනට් අමාත්‍යවරයන්, රාජ්‍ය අමාත්‍යවරයන් හා නියෝජ්‍ය අමාත්‍යවරයන් සඳහා වාහන මිලදී ගත් අවස්ථා කවරේද;

(ii) එක් එක් වාහනයේ වර්ගය හා මිල කවරේද;

(iii) එම වාහන සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1979/'17

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තිරියාය ප්‍රදේශයේ පිහිටි ගිරිහඬු සෑය පූජා භූමියට අයත් ඉඩම් මැන අවසන් කර තිබේද;

(ii) එසේ නම්, මැන හඳුනාගත් භූමිය මත සලකුණු යෙදීම සිදුකර තිබේද;

(iii) මැනීම් මඟින් හඳුනාගෙන ඇති පූජා භූමියට අයත්වන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) අදාළ පිඹුරුපත් බුද්ධශාසන අමාත්‍යාංශයට ලබා දීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1989/'17

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 11, දුම්රියපොළ පාර, මන්නාරම යන ලිපිනයෙහි පිහිටා ඇති (ඔප්පු අංක 16) පර්චස් 190ක භූමිභාගය, 1872.12.17 දින මන්නාරම ඉඩම් කාර්යාලය විසින් මෙතොදිස්ත සභාවට අයත් ඉඩමක් ලෙස ලියාපදිංචිකර ඇති (ලියාපදිංචි අංක B 1/53) බවත්;

(ii) 1985 වර්ෂයේ රටේ ඇති වූ නොසන්සුන් වාතාවරණය හේතුවෙන් මෙම ඉඩම නඩත්තු කිරීමට නොහැකිව පැවති අවස්ථාවේදී, ශ්‍රී ලංකා යුද හමුදාව අදාළ ඉඩමෙහි කාර්යාලයක් ස්ථාපිත කළ බවත්;

(iii) එම කාර්යාලය සඳහා මන්නාරම නගරයට ආසන්න ප්‍රදේශයක භූමිභාගයක් වෙන්කරදී වර්ෂ 3කට අධික කාලයක් ගත වී ඇතත්, මෙතෝදිස්ත සභාවට අයත් මෙම ඉඩම මේ දක්වා යුධ හමුදාව විසින් නිදහස්කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ වනවිට මෙතෝදිස්ත සභාවට දැඩිලෙස අවශ්‍ය වී ඇති අදාළ ඉඩම ඉක්මනින් මුදාහැරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1991/’17

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතුයායවල් පිහිටි ප්‍රදේශවල පිහිටා තිබෙන ප්‍රාදේශීය සභාවන්ට තමන්ගේ සේවාවන් ඉටු කිරීමට නොහැකිවනසේ ප්‍රාදේශීය සභා නීති විධිවිධානයන් අන්තර්ගත වී ඇති බවත්;

(ii) ඒවා සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති බවත්;

(iii) මේ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම නීති, විධිවිධාන සංශෝධනවල වත්මන් තත්ත්වය කවරේද;

(ii) එම සංශෝධන සිදු කිරීම සඳහා කිසියම් බාධාවන් තිබේද;

(iii) මෙම නීති සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1994/’17

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර ශික්ෂණ රෝහල සතු මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ප්‍රමාණයෙන් දැනට රෝහල විසින් භාවිතා කරනු ලබන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) රෝහල සතු ඉඩම්වලින්, විශාල භූමි ප්‍රමාණයක් අනවසරයෙන් භුක්ති විඳින බව දන්නේද;

(iv) එම තත්ත්වය රෝහලේ කටයුතුවලට බාධාවක් වී ඇති බව පිළිගන්නේද;

(v) එසේ නම්, මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1995/'17

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2017 ජූනි 30 දක්වා ජනාධිපතිවරයා විසින් ජනාධිපති නීතිඥයන් වශයෙන් නම් කරන ලද පුද්ගලයන්ගේ නාමලේඛනයක් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(ii) ජනාධිපති නීතිඥයන් නම් කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2073/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේදී වවුනියාව, නෙඩුන්කර්ණි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, පුදුවිලාන්කුලම්, පුට්කුලම්, කුංජුකුලම්, මන්නකුලම්, කොල්ලර් පුලියන්කුලම් යන ගම්මාන 05ක පවුල් 270ක් පමණ නැවත පදිංචි කරන ලද බවත්;

(ii) මෙම ගම්මාන මුලතිව් සහ වවුනියාව යන දිස්ත්‍රික්කවලට මායිම්ව පවතින බවත්;

(iii) නැවත පදිංචි කරන ලද කාලයේ සිට මේ දක්වා මෙම ජනතාවට කිසිදු මූලික පහසුකම් හෝ නොමැතිව දැඩි පීඩාවන්ට මුහුණ පා සිටින බවත්;

(iv) A - 9 මාර්ගයට පැමිණීම සඳහා ප්‍රවේශ මාර්ග නොමැති වීම සහ ගම්මාන හරහා තිබෙන දුම්රිය මාර්ගයට හරස්ව වැටී ඇති පාරවල් සඳහා ආරක්ෂාකාරි දුම්රිය ගේට්ටු නොමැති වීමෙන් මෙම ජනතාව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගම්මානවලට අවශ්‍ය මූලික පහසුකම් ලබා දීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පහසුකම් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2118/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.05.27 දින ඇති වූ ගංවතුර හා නායයෑමේ ආපදා තත්ත්වයෙන් කළුතර දිස්ත්‍රික්කය තුළ මියගිය සහ අතුරුදන් වූ පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගංවතුරෙන් හා නායයෑමෙන් මියගිය පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම ව්‍යසනයෙන් මියගිය සහ අතුරුදන් වූ පුද්ගලයන්ගේ,

(i) නම,ලිපිනය,වයස,රැකියාව සහ ස්ත්‍රී / පුරුෂ භාවය;

(ii) ග්‍රාම නිලධාරී වසම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය;

(iii) ළඟම ඥාතිවරයාගේ නම සහ ලිපිනය;

කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එලෙස මියගිය හෝ අතුරුදහන් වූ පුද්ගලයන් වෙනුවෙන් මේ වනවිට වන්දි ගෙවා තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන්ගේ නම් සහ ගෙවා ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වන්දි ගෙවා අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත (2018) — (දෙවැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 නොවැම්බර් 09) [1].

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 12, 14 සහ 22 වගන්ති සමඟ කියවිය යුතු, 32 වගන්තිය යටතේ, සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 28 දිනැති අංක 2029/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.10.09 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 996 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 සහ 321 වගන්ති යටතේ මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 08 දිනැති අංක 2018/3 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත, 2016 ඔක්තෝබර් 04 දිනැති අංක 1987/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.10.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2016.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.01.26 දින සලකා බලන ලදී.)

*7.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2017.03.07 වැනි දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.03.24 දින සලකා බලන ලදී.)

*8.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2014,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2017.05.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.26 දින සලකා බලන ලදී.)

*9.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන - 2011,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.12.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.23 දින සලකා බලන ලදී.)

*10.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන - 2015,— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.01.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*11.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන - 2015,— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.01.25 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*12.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන - 2015,— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.03.08 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*13.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන - 2014,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.03.21 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ස්වාධීන විගණකවරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.23 දින සලකා බලන ලදී.)

*14.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*15.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල් මණ්ඩල පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2016.07.21 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*16.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.08.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*17.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන - 2014,— 2007 අංක 7 දරන සමාගම් පනත සහ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනත අනුව 2017.03.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද කේ.පී.එම්.ජී. වරලත් ගණකාධිකාරීවරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*18.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන - 2014,— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.05.05 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*19.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන - 2014,— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.09.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*20.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන - 2014,— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.05.05 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*21.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— සී/ස හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන - 2014,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.11.15 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සී/ස හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*22.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන - 2014,— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.10.28 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*23.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන - 2014/2015,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.08.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.03.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරීවරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.08.23 දින සලකා බලන ලදී.)

*24.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ රෝහල් මණ්ඩල පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) සී වගන්තිය යටතේ 2016.08.12 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*25.

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා,— අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන - 2013,— 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය යටතේ 2016.08.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2016.10.05 දින සලකා බලන ලදී.)

*26.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා,— ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත අනුව 2016.10.25 වැනි දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.08.09 දින සලකා බලන ලදී.)

*27.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා,— ඉදිකිරීම් අභ්‍යාස සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1957 අංක 49 දරන රජයේ කාර්මික සංස්ථා පනතේ 2 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ හා 1992 ජූනි මස 10 දිනැති අංක 718/15 දරන අති විශේෂ ගැසට්පත්‍රය අනුව 2016.10.25 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඉදිකිරීම් අභ්‍යාස සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.08.09 දින සලකා බලන ලදී.)

*28.

ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත යටතේ 2016.11.18 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.03.09 දින සලකා බලන ලදී.)

*29.

ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2014,— 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත යටතේ 2016.11.18 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.03.09 දින සලකා බලන ලදී.)

*30.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2014,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2016.12.05 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.08.10 දින සලකා බලන ලදී.)

*31.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා,— රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ 2017.01.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.08.09 දින සලකා බලන ලදී.)

*32.

ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා,— ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2017.01.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.08.10 දින සලකා බලන ලදී.)

*33.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන - 2015/2016,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.03.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.08.23 දින සලකා බලන ලදී.)

*34.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013/2014,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2015.03.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.03.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරීවරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.08.23 දින සලකා බලන ලදී.)

*35.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2014,— 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතේ 24 වගන්තිය යටතේ 2016.10.27 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.02.09 දින සලකා බලන ලදී.)

*36.

සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යතුමා,— සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2014,— 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 11 වගන්තිය යටතේ 2016.11.12 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.02.09 දින සලකා බලන ලදී.)

*37.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 17 වගන්තිය යටතේ 2016.01.27 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.02.09 දින සලකා බලන ලදී.)

*38.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2014,— 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 17 වගන්තිය යටතේ 2016.12.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.02.09 දින සලකා බලන ලදී.)

*39.

විදේශ රැකියා අමාත්‍යතුමිය සහ අධිකරණ අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශ පනතේ 19 වැනි වගන්තිය යටතේ 2016.06.08 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2016.10.05 දින සලකා බලන ලදී.)

*40.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 34 වගන්තිය යටතේ 2016.05.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.03.09 දින සලකා බලන ලදී.)

*41.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 34 වගන්තිය යටතේ 2016.11.15 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.03.09 දින සලකා බලන ලදී.)

*42.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2016.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(තිරසර සංවර්ධනය හා පරිසර සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.03.09 දින සලකා බලන ලදී.)

*43.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012/2013,— 1970 අංක 33 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථා පනත යටතේ 2016.07.07 දින ඉදිරිපත් කරන ලද, 2013.03.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ස්වාධීන විගණකවරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2016.10.04 දින සලකා බලන ලදී.)

*44.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013/2014,— 1970 අංක 33 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථා පනත යටතේ 2017.02.09 දින ඉදිරිපත් කරන ලද, 2014.03.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ස්වාධීන විගණකවරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.04.07 දින සලකා බලන ලදී.)

*45.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය,— ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1996 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 32 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (ඉ) වගන්තිය යටතේ 2016.06.07 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.02.21 දින සලකා බලන ලදී.)

*46.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන - 2013,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2017.05.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ස්වාධීන විගණකවරුන් වන එස්. ජේ. එම්. එස්. වරලත් ගණකාධිකාරී වරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.09.06 දින සලකා බලන ලදී.)

*47.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන - 2014,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2017.08.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ස්වාධීන විගණකවරුන් වන එස්. ජේ. එම්. එස්. වරලත් ගණකාධිකාරී වරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.09.06 දින සලකා බලන ලදී.)

*48.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන - 2014,— 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 35 (3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2017.07.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.09.06 දින සලකා බලන ලදී.)

*49.

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32 (3) වගන්තිය යටතේ 2016.04.05 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2016.10.07 දින සලකා බලන ලදී.)

*50.

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— සී/ස ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012/2013,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2016.01.28 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සී/ස ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.08.10 දින සලකා බලන ලදී.)

*51.

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— සී/ස ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013/2014,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2016.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සී/ස ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.08.10 දින සලකා බලන ලදී.)

*52.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 වගන්තිය යටතේ 2017.01.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුබසාධන සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*53.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1970 අංක 07 දරන හෝමියෝපති පනතේ 40 වගන්තිය යටතේ 2017.01.25 වැනි දින ඉදිරිපත් කරන ලද 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුබසාධන සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*54.

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2015.10.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.01.26 දින සලකා බලන ලදී.)

*55.

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2016.06.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.01.24 දින සලකා බලන ලදී.)

*56.

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2014,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2016.11.12 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.01.26 දින සලකා බලන ලදී.)

*57.

ක්‍රීඩා අමාත්‍යතුමා,— සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය යටතේ 2016.06.24 වැනි දින ඉදිරිපත් කරන ලද 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.02.21 දින සලකා බලන ලදී.)

*58.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*59.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*60.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජුනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

61.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

62.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

63.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

64.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

65.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

66.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

67.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

68.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

69.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---